# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1308 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 13/08/2024<br>පැය 0540 |

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - ඇතිමලේ පොලිස් වසම.

2024.08.11 වන දින උදෑසන කාලයේ ඇතිමලේ පොලිස් වසමේ කොටියාගල ප්‍රදේශයේ නිවසක පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහර දී ඝාතනය කර ඇති බවට ලද පණිවිඩයක් මත ඇතිමලේ පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 45 ක් වූ කම්මල්යාය, කොටියාගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තවත් පුද්ගලයෙකු සමග ඇති වූ පුද්ගලික ආරවුලක් හේතුවෙන් මෙම මනුෂ්‍ය ඝාතනය සිදුව ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත.

2024.08.12 වන දින සිද්ධියට සම්බන්ධ වයස අවුරුදු 27ක් වන කොටියාගල ප්‍රදේශයේ පදිංචි සැකකරු අත්අංඩංගුවට ගෙන ඇත. ඇතිමලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

### 02. මනුෂ්‍ය ඝාතනයකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - එරාවූර් පොලිස් ස්ථානය.

2024.08.06 වන දින රාත්‍රී කාලයේ එරාවූර් පොලිස් වසමේ මිච්චිනගර් ප්‍රදේශයේදී **වයස අවුරුදු 52 ක් වූ මිච්චිනගර්, එරාවූර් ප්‍රදේශයේ** පදිංචි පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කිරීමේ අපරාධය සම්බන්ධයෙන් එරාවූර් පොලිසිය විසින් විමර්ශන සිදුකර සිද්ධියට සම්බන්ධ සැකකරු 2024.08.12 වන දින උදෑසන කාලයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 26ක් වන එරාවූර් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු මුදල් හා ඒ.ටී.එම්. කාඩ්පතක් සොරකම් කර එම කාඩ්පත භාවිතා කර මුදල් ලබා ගැනීමේ අපරාධයක් සම්බන්ධයෙන් අවශ්‍ය කර සිටි සැකකරුවෙකු බවටද අනාවරණය වී ඇත. එරාවූර් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. දියේ ගිලී පුද්ගලයෙකු මියයාම - නාල්ල පොලිස් වසම

2024.08.12 වන දින දහවල් කාලයේ නාල්ල පොලිස් වසමේ කීලම්පිටිය ප්‍රදේශයේ මා ඔයේ දියේ ගිලී පුද්ගලයෙකු මියගොස් ඇති බවට නාල්ල පොලිසියට ලද පණිවිඩයක් සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 35 ක් වන නාල්ල, දිවුල්දෙනිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තවත් පුද්ගලයෙකු සමග මා ඔය හරහා එහි මංකඩකින් එගොඩ වීමට යාමේදී සැඩ පහරකට අසුවී ගසාගෙන ගොස් මෙලෙස දියේ ගිලී ඇති බවට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය වතුපිටිවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර නාල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය.

2024.08.12 වන දින සවස් කාලයේදී පිළියන්දල පොලිස් වසමේ ප්‍රගති මාවත හන්දියේදී බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 660 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පිළියන්දල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වන පිළියන්දල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පිළියන්දල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - මංගලගම පොලිස් ස්ථානය.

2024.08.12 වන දින සවස් කාලයේදී මංගලගම පොලිස් වසමේ උන්නිච්චිය රක්ෂිත ප්‍රදේශයේදී මංගලගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වූ කොක්කඩිචෝලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මංගලගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - කොබෙයිගනේ පොලිස් වසම.

2024.08.12 වන දින සවස් කාලයේ කොබෙයිගනේ පොලිස් වසමේ කොබෙයිගනේ කට්ටාපිටිය අතුරු මාර්ගයේ පහල බලදොර ප්‍රදේශයේදී කොබෙයිගනේ දෙස සිට කට්ටාපිටිය දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරු සහ එහි පිටුපස ගමන්කළ යතුරුපැදිකරුගේ සහෝදරියක් වන කුඩා දැරියක් නිකවැරටිය රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී දැරිය මියගොස් ඇත.

**මියගිය දැරිය වයස අවුරුදු 13 ක් වූ පහල බලදොර, කොබෙයිගනේ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය නිකවැරටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කොබෙයිගනේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07.** **මාරක රිය අනතුරක් - දික්වැල්ල පොලිස් වසම.**

2024.08.12 වන දින රාත්‍රී කාලයේ දික්වැල්ල පොලිස් වසමේ මාතර කතරගම මාර්ගයේ මාලියද්ද ප්‍රදේශයේදී දික්වැල්ල දෙස සිට මාතර දෙසට ධාවනය වූ යතුරු පැදියක් මාර්ගය හරහා ගමන් කල ගවයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු බරපතල තුවාල ලබා බතීගම රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා මාතර රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 62 ක් වූ පාතෙගම මධ්‍යම, කෝට්ටගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මාතර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර දික්වැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08.** **මාරක රිය අනතුරක් - මොරගහහේන පොලිස් වසම.**

2024.08.12 වන දින රාත්‍රී කාලයේ මොරගහහේන පොලිස් වසමේ වීදියගොඩ දියකඩ මාර්ගයේ දෙවෙනි පාලම අසලදී වීදියගොඩ දෙස සිට දියකඩ දෙසට ධාවනය වූ ලොරි රථයක් රියදුරුට රථය පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන අනතුරක් සිදුව ඇත. අනතුරින් රියදුරු බරපතල තුවාල ලබා බණ්ඩාරගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 67 ක් වූ හාලපිටිය, වැල්මිල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය බණ්ඩාරගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මොරගහහේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**